# 1.42 හරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයෙ හි දැක්වෙන නාට්‍ය වෘත්ති ආශ්‍රයෙන් සඳකිඳුරු කෝලම පිළිබඳ විග්‍රහයක්

ආර්.බී. රණවීර
දෘශ්‍ය කලා සැළසුම්කරණ හා ප්‍රාසංගික කලා ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

දකුණු ආසියාතික ප්‍රාසංගික කලා විෂයෙහි සම්භාව්‍ය සම්ප්‍රදාය සහ ජන සම්ප්‍රදාය අතර පැවැති අන්‍යෝන්‍ය සම්බන්ධතා ගවේෂණය කිරීමේ අරමුණින් කර ගෙන යනු ලබන පුළුල් පර්යේෂණ ව්‍යාපෘතියක, මේ දක්වා ලබා ඇති ප්‍රගතිය විද්වත් අවධානයට යොමු කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් අපේක්ෂා කෙරේ. මෙහි දී අධ්‍යයනයට ලක් වී ඇත්තේ හරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයෙහි සඳහන් ඇතැම් ශිල්ප ධර්ම කොතෙක් දුරට ශ්‍රී ලංකාවේ කෝලම් නාට්‍ය සම්ප්‍රදායෙහි පිළිබිඹු වන්නේ ද යන කරුණ යි.

ඉතා ජනප්‍රිය කෝලම් නාටකයක් වන සඳකිඳුරු කෝලමෙහි හරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයෙහි විසි වන පරිච්ඡේදයේ සඳහන් සතර විධ නාට්‍ය වෘත්ති දක්නට ලැබෙන්නේ ද යන්න විමර්ශනයට ලක් විය. මේ සඳහා මුද්‍රිත පිටපත් හතරක් සහ සඳකිඳුරු කෝලම රංග ගත වූ අවස්ථා තුනක් තෝරා ගන්නා ලද අතර එම කෝලම්හි කථා වින්‍යාසය, චරිත නිරූපණය, රංග වින්‍යාසය, ආනුෂාංගික අංග හා රස නිෂ්පත්තිය යන අංග ලක්ෂණ නාට්‍ය ශාස්ත්‍රයෙහි සඳහන් සතර විධ නාට්‍ය වෘත්ති හා සමග ආකෘතිමය සහ ව්‍යුහමය වශයෙන් කොතෙක් දුරට සමානතා සහ අසමානතා පළ කරන්නේ ද යන්න පරීක්ෂාවට භාජනය විය. මෙම අධ්‍යයනයේ දී සඳකිඳුරු කෝලම් නාටකයෙහි බොහෝ දුරට නාට්‍ය ශාස්ත්‍රයෙහි එන සතර විධ වෘත්ති අතරින් ආරභටී වෘත්තියත් භාරතී වෘත්තියත් ප්‍රධාන ලෙස අන්තර්ගත ව පවතින බව තහවුරු වේ.